# උපාය මාර්ගික සැලැස්ම

# 2019 - 2021



## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

## වලස්මුල්ල

## ප්‍රාදේශීය ලේකම්තුමාගේ පනිවුඩය

සියළුම මූලා‍ ප්‍රභවයන් මූලික කොට ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන සෑම වැඩසටහනක්ම කාලෝචිත පරිදි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම වෙනුවෙන් මහගු කාර්යභාරයක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබයි. සිය සේවාව දැඩිසේ කැපකිරීමකින් නොපිරිහෙලා ඉටුකරමින් ප්‍රදේශයේ ජනතාවට උසස් ජීවන තත්ත්වයක් අත්කරදීම වෙනුවෙන් වැඩසටහන් සැලසුම් කිරීම මෙහිදී සිදුකෙරේ. ග්‍රාමීය ජනතාවගේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම පිණිස ලැබෙන සියළු මූලා‍ ප්‍රභවයන් නිසියාකාර ක්‍රමවේදයන් අනුගමනය කරමින් සමානාත්මතාවයකින් යුතු ප්‍රතිපත්තීන් ඉලක්ක කර ගනිමින් සහ කොට්ඨාසයේ විෂමතාවයකින් තොරව පොදු ජනතාව සමග අත්වැල් බැඳ ගනිමින් තිරසාර සංවර්ධන ක්‍රියාවලියකට අවතීර්ණ වීම අත්‍යාවශ්‍ය වී ඇත. ඒ අනුව 2019 වර්ෂයේ පෙරට වඩා ඉදිරි පියවරක් තබන්නට උත්සාහ කිරීම මෙහිදී මූලික අභිප්‍රාය කර ගැනීම වැදගත් වේ. පසුගිය වර්ෂ වලදී ලබාගත් අත්දැකීම් සමග යමින් ප්‍රදේශයේ ජනතාවට උසස් ජීවන තත්ත්වයක් අත්කර දීමේ සිහිනය යතාර්ථයක් බවට පත්කිරීම සඳහා ඉලක්ක කරන ලද සියළුම කටයුතු නොපිරිහෙලා ඉටුකිරීම සියළුම අංශයන්හි වගකීමයි. ඕනෑම ක්ෂේත්‍රයක කටයුතු සැලසුම් කිරීමේදී අත්දැකීම් හා සමකල හැකි තවත් කිසිවක් නොමැත. ඒ අනුව යමින් නිශ්චිත ක්‍රමවේදයන්ට අනුව සැලසුම් සකස් කිරීමේදී බොහෝ දුරට බලපානු ලබන්නේ අප සිතන පරිදි අපගේම අගයන්ය. ඒ අනුව අපවෙත කළහැකි මට්ටමෙන් ඵලදායීව කාර්ය සාධනය ළඟා කරගැනීම පිණිස ඉලක්කගත ප්‍රවේශයකට යාම බෙහෙවින්ම වැදගත්ය. වර්ෂ අවසානයේ ලබාගත් ඉලක්කයන් අවබෝධ කර ගැනීමේදී තම තමන්ගේ විෂය රාජකාරින් වල කාර්ය සාධනය (KPI )මැනගැනීම තමා විසින්ම කරගත හැකිය.

සමස්ථයක් ලෙස කොට්ඨාසය තුළ සේවාලාභී මහජනතාව වෙත සේවාවන් ඉටුකිරීමට සියළු නිලධාරින් උනන්දුවක් ඇතිකරගන්නේ නම් මෙහි මහගු ප්‍රතිඵලයක් ලබා ගතහැකි බව සඳහන් කරමි. ඒ අනුව ක්‍රියාත්මක වන දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයේ පාර්ශවකරුවන් ලෙස තිරසර සංවර්ධන අරමුණු (SDG) මුදුන් පමුණුවා ගැනීමටත් ඕනෑම අභියෝගයක් ජයග්‍රහණය කරමින් තම රාජකාරි කටයුතු සිදුකිරීමටත් සියළුම ක්ෂේත්‍රයන් නියෝජනය කරන නිලධාරින්ට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.

අයි.ආර්.කේ.විතාරණ
ප්‍රාදේශීය ලේකම්

# හැඳින්වීම

වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරි වසම් 53 කින් යුක්ත ව.කි.මී 104 ක වපසරියක් ඇති කොට්ඨාසයකි. මෙහි මුළු ජනගහණය 48729 ක් වන අතර ස්ත්‍රී ජනගහණය 24685 ක්ද පුරුෂ ජනගහණය 24044 ක් ද වේ. පවුල් 13797 ක් ජීවත් වන අතර බෙහෙවින්ම ග්‍රාමීය ජීවන වටපිටාවකට උරුමකම් කියන කොට්ඨාසයක් ලෙස සැලකිය හැකිය. මෙහි ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. කොට්ඨාසයේ සියලුම දෙනාගේ උපතේ සිට මියයාම දක්වාම ඔවුන්ගේ ජීවිතයට සමීප ආයතනයක් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉටුවන මෙහෙය අපරිමිතය.

විවිධ වූ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ග්‍රාමීය ජනතාවගේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් තුමා ඇතුලු සියලුම කාර්ය මණ්ඩලය කැපවී කටයුතු කරයි. ඒ අතර විවිධ වූ ක්ෂේත්‍රයන් වෙනුවෙන් විවිධ රේඛීය අමාත්‍යාංශ වලට අනුයුක්ත වූ ක්ෂේත්‍ර නිලධාරින් ජනතාවගේ අභිවෘද්ධිය පිණිස ප්‍රාදේශීය ලේකම් තුමාගේ උපදෙස් පරිදි විවිධ ක්‍රමවේද අනුගමනය කරමින් කොට්ඨාසය තුළ ජනතාවගේ විවිධ ගැටළු හා ප්‍රශ්න හඳුනාගනිමින් ප්‍රමුඛතාගත සැලැස්මක් ඔස්සේ සාර්ථක සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට වර්ෂය මුලාරම්භයේ සිටම සැළසුම් සකස් කරයි. මෙහිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලුම ක්ෂේත්‍රයන්හි නියුක්ත ක්ෂේත්‍ර නිලධාරින් ඔවුන්ගේ රාජකාරි කටයුතු ඉටුකිරීමේදි ඔවුන්ගේ ඉලක්ක ජයග්‍රහණය කිරීමට උත්සාහ දරයි. එහිදී සහශ්‍ර සංවර්ධන අරමුණු (SDG ) 17 ක් ඔස්සේ ගලපා ගනිමින් ඔවුන්ගේ කාර්ය සාධන දර්ශකය (KPI))වර්ෂය අවසාන වන විට කොතෙක් දුරට සපුරාගෙන ඇත්දැයි මැන බැලීමක් සිදුකෙරේ.

ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අනුයුක්ත සියළුම ක්ෂේත්‍ර නිලධාරින් සහ කාර්යාල නිලධාරින් විසින් 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත උපාය මාර්ගික සැලැස්ම මෙහි පෙළ ගස්වා ඇත.

# දැක්ම

රාජ්‍ය ප්‍රතිපත්තීන් අනුව

ජනතා මෙහෙවර ක්‍රියාත්මක කරමින්

ජනතා ප්‍රසාදය ලද

හොඳම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වීම.

# මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව

සේවා සැපයීම,සම්පත් සම්බන්ධීකරණය සහ

ජනතා සහභාගිත්වයෙන් යුත්

කාර්යක්ෂම, තිරසාර සහ සැලසුම් සහගත

සංවර්ධන ක්‍රියාවලියක් තුළින්

ප්‍රදේශයේ ජනදිවිය නංවාලීම.

# තේමාව

# ස්තූතිය..

ක්‍රියාත්මක කිරීමට යෝජිත සියළු සැලසුම් ක්‍රියාවලියෙහි යෙදෙන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය , මහජන නියෝජිතයන් හා අදාල අනෙකුත් ආයතන වල නිලධාරින් සමග සංවර්ධන න්‍යාය පත්‍රය සැලසුම් කිරීම, මෙහෙයවීම, ප්‍රගති සමාලෝචනය හා ඇගයීම ,නිරන්තර අධීක්ෂණයට ලක් කරමින් කොට්ඨාසයේ සංවර්ධන ක්‍රියාදාමය නිවැරදි හා කඩිනම් සංවර්ධන ක්‍රියාවලියකට අන්තර්ගත වියයුතු බවට නිලධාරින් උනන්දු කරවමින්, සහයෝගය ලබාදෙමින් මගපෙන්වන වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් අයි.ආර්.කේ.විතාරණ මැතිතුමන්ට ගෞරව පූර්වක ස්තූතිය පිරිනැමේ. සියළු ක්ෂේත්‍රයන්හි කටයුතු ඉලක්ක කරගනිමින්, නිසියාකාර ක්‍රමවේදයන් ඔස්සේ ඉදිරි සැලසුම් සකස් කර ගැනීමට නිරතුරුවම මග පෙන්වමින් මහගු කාර්යභාරයක් ඉටුකරනු ලබන සහකාර ප්‍රාදේශීය ලේකම් සුසන්ති ජයසිංහ මෙනවියටද විශේෂයෙන් ප්‍රශංසා කළ යුතුය. සංවර්ධන ක්ෂේත්‍රයන්හි කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් සපයමින් නිරතුරු අධීක්ෂණ කටයුතු සිදුකරන සහකාර අධ්‍යක්ෂ එච්.කේ.ඒ.රම්‍යලතා මහත්මියටද විශේෂ ස්තූතිය හිමිවේ..එමෙන්ම මෙම කාර්යය ක්‍රමවත්ව පිළිවෙළකට කාර්යක්ෂමව හා නිවැරදිව කලට වේලාවට ඉටුකිරීම සඳහා තොරතුරු ලබාදුන් වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධ සියළු නිලධාරීන්ටත්, රේඛීය අමාත්‍යංශ නියෝජනය කරන සියළුම ක්ෂේත්‍ර නිලධාරින්ටත් මෙය සකස් කිරීමට සහයෝගය දැක්වූ ආයතන අංශයේ සියළුම නිලධාරින්ටත් විවිධ අයුරින් උදව් කළ කාර්යාලයේ අනෙකුත් නිලධාරින්ටත් කෘතවේදිත්වය පිරිනමමි.

තිරසර සංවර්ධන අරමුණු

1. සෑමදෙසකම, සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිමා කිරීම.
2. සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කරගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
3. නිරෝගිමත් ජීවිතයක් සහතික කර, සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරිම.
4. සංයුක්ත හා සමානාත්මතාවෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා උදාකර දීම.
5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියළු කාන්තාවන් සහ ගැහැණු දැරියන් සවිබල ගැන්වීම
6. සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීම සහ තිරසර කළමනාකරණය
7. දැරියහැකි, විශ්වසනීය, තිරසර නව බලශක්ති සැපයුම සහතික කිරීම
8. ධරණීය, සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය, සැමට පූර්ණ සහ ඵලදායී රැකියා හා නිසි කාර්ය ප්‍රවර්ධනය
9. ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරි ගැන්වීම
10. රටවල් තුළ හා රටවල් අතර පවතින අසමානතා අවම කිරීම
11. නගර හා ජනාවාස සංයුක්ත, සුරක්ෂිත, ස්ථායී සහ තිරසර කරලීම
12. තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් සහතික කිරීම
13. දේශගුණික විපර්යාස හා එහි බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම
14. තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය
15. භෞමික පාරිසරික පද්ධතීන් සුරක්ෂිත කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ඉඩම් හායනය වළක්වා ප්‍රතිවර්තනය කිරීම සහ ජෛව විවිධත්ව විනාශය නවතාලීම
16. තිරසර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය, යුක්තිය උදෙසා සැමට ප්‍රවේශය ලබාදීම සහ ඵලදායී, වගවීම් සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම
17. තිරසර සංවර්ධනය සඳහා වන්නාවූ ගෝලීය සහයෝගිතා ක්‍රියාදාමය සවිමත් කිරීම හා පුනර්ජීවනය

# පටුන


| | |
|---|---|
| **01.**ආයතන අංශය | **10 - 11** |
| **02.**ගිණුම් අංශය | **12 - 13** |
| **03.** සංවර්ධන අංශය | **14 - 17** |
| **04.** ඉඩම් අංශය | **18 - 20** |
| **05.**සමාජ සේවා අංශය | **21 - 32** |
| **5.1.** සමාජ සේවා ( පළාත් සභා) | **22** |
| **5.2.** සමාජ සේවා ( මධ්‍යම රජය) | **23** |
| **5.3.** උපදේශන සේවා | **24** |
| **5.4.** මුල් ළමාවිය සංවර්ධන සහකාර | **25** |
| **5.5.** ළමා හිමිකම් ප්‍රවර්ධනසහකාර | **26** |
| **5.6.** කාන්තා කටයුතු | **27** |
| **5.7.** උපදේශනකටයුතු | **28** |
| **5.8.** වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන | **29** |
| **5.9.** ප්‍රාදේශීය ළමා ආරක්ෂණ කටයුතු | **30** |
| **5.10.**ආපදා සහන සේවා කටයුතු | **31** |
| **5.11.** විදුලි සංදේශ,විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යංශය | **32** |

06.ක්ෂේත්‍ර නිලධාරී අංශය 33 - 47

6.1.මානව සම්පත් සංවර්ධන කටයුතු 34

6.2.ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු 35

6.3.කුඩා ව්‍යාපාර සංවර්ධන කටයුතු 36

6.4.ග්‍රාමීය ආර්ථික සංවර්ධන කටයුතු 37

6.5.කෘෂිකර්ම සංවර්ධන කටයුතු 38

6.6.අපනයන සංවර්ධන කටයුතු. 39

6.7.බෞද්ධකටයුතු. 40 - 41

6.8.ආයුර්වේද සංවර්ධනකටයුතු. 42

6.9.ව්‍යවසාය සංවර්ධනකටයුතු. 43

6.10.ග්‍රාම සංවර්ධනකටයුතු. 44

6.11.තරුණ සේවාකටයුතු. 45

6.12.පූජා භූමි සංවර්ධනකටයුතු. 46

6.13.සංස්කෘතිකකටයුතු 47

**07.** විදාතා අංශය 48 - 50

**08.** සමෘද්ධි අංශය 51 - 53

# ආයතන අංශය

| අරමුණ | උපාය මාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපාරයට නිත්‍යානුකූලතාවයක් ලබාදීම | ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ලියාපදිංචි නොවූ ව්‍යාපාර සම්බන්ධ තොරතුරු රැස්කර ඒවා ලියා පදිංචි කිරීමට සැලැසුම් කිරීම | 12 | ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව | 67 | 111 | 113 | 115 | 120 |
| පුද්ගලයින්ගේ අනන්‍යතාවය සහ සමාජ සුරක්ෂිතතාවය තහවුරු කිරීම | ප්‍රදේශයේ විවාහ නොවූ නමුත් අඹු සැමියන් ලෙස ජීවත් වන පිරිස් හඳුනාගෙන විවාහ කිරීම | 11,16 | ලියාපදිංචි කරනු ලබන විවාහ සංඛ්‍යාව | - | 7 | 10 | 15 | 25 |
| ජාතික හැඳුනුම්පත් නිර්දේශ ලබා දීම | සෑම සතියකම හැඳුනුම්පත් අයදුම්පත් දත්ත පද්ධතියට ඇතුළත් කිරීම. | 11 | ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව | - | 1863 | 2100 | 2200 | 2300 |
| වැටුප් වර්ධක ලබා දීම තුලින් නිලධාරීන්ගේ ජොෂ්ඨතාව ඇඟයීම | වාර්ෂිකව වැටුප් පරිවර්තන ලිපි සැකසීම හා මඟහැරුණු වැ/ප යාවත්කිලීන කිරීම | 8 | වැටුප් පරිවර්තන සැකසිය යුතු පෞද්ගලික ලිපි ගොනු ගණනට, නිකුත් කළ වැටුප් පරිවර්තන ලිපි ගණන දරණ අනුපාතය | - | 166 | 166 | 166 | 166 |
| විදුලියපරිභෝජනය අඩු කර ගැනීම | පත්‍රිකා මඟින් දැනුවත් කිරීම | 12 | පරිභෝජනය කළ ඒකක ප්‍රමාණය | 11,454 | 14374 | 1436 4 | 14352 | 14337 |

# ගිණුම් අංශය

| අනු අංකය | අරමුණ | උපාය මාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) | පාදක අගය 2016 | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 2019 | 2020 | 2021 |
| 01 | ප්‍රවාහන පද්ධතියට නීත්‍යානුකූල භාවයක් එක් කිරීම. | නිකුත් කරන ආදායම් බලපත්‍ර සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා නිලධාරීන් වැඩි පිරිසකට අදාල විෂය දැනුම ලබාදීම තුළින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම | 17 | ඉදිරිපත් වන වාහන හිමියන් සංඛ්‍යාව | 12500 | 13884 | 15600 | 16500 | 17000 |
| 02 | විශ්‍රාමිකයින්ගේ මානසික සුවය ලඟා කිරීම තුළින් නීරෝගී විශ්‍රාමික පිරිසක් බිහිකිරීම. | විශ්‍රාමික ඉල්ලීම් ලැබෙන තෙක් නොසිට සියළුම ලිපි ගොනු අධ්‍යයනය කර හිඟ වැටුප් සකස් කළ යුතු ලිපි ගොනු තෝරා හිඟ වැටුප් සකස් කිරීම. | 03 | හිඟ වැටුප් සකස් කළ යුතු ගොනු සංඛ්‍යාව | 155 | ගොණු156 ක හිග වැටුප් සකස් කර ඇත. | ලැබෙන සියලුම ගොණු වලට අදාල හිග වැටුප් සකස් කිරීම | ලැබෙන සියලුම ගොණු වලට අදාල හිග වැටුප් සකස් කිරීම | ලැබෙන සියලුම ගොණු වලට අදාල හිග වැටුප් සකස් කිරීම |
| 03 | කඩිනමින් හිඟ වැටුප් ගෙවීම තුළින් නිලධාරීන්ගේ මානසික තෘප්තිය ඉහළ යාමෙන් කාර්යක්ෂමතාවය වැඩිවීම | හිඟ වැටුප් සකස් කිරීමට අවශ්‍ය ලිපි ලේඛන අදාල පාර්ශව වෙතින් කඩිනමින් ගෙන්වා ගෙන හිඟ වැටුප් සකස් කිරීම. | 08 | දින 15 ක් තුළ සකස් කරන හිඟ වැටුප් සංඛ්‍යාව | 78 | 85 | ලැබෙන සියළුම වැටුප් පරිවර්තන ලිපි | ලැබෙන සියළුම වැටුප් පරිවර්තන ලිපි | ලැබෙන සියළුම වැටුප් පරිවර්තන ලිපි |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 04 | භාවිතයෙන් ඉවත් කරන භාණ්ඩ පහසුවෙන් හඳුනාගැනීම හා ඉල්ලුම් කරන උපකරණ පහසුවෙන් නිකුත් කළ හැකිවීම. | සිගාස් වැඩ සටහනට සියළුම උපකරණ ඇතුළත් කර ඇති අතර එම වැඩ සටහන මගින් ලබාදී ඇති සංකේත අංක අදාල උපකරණ වලට යෙදීම. | 15 | කාර්යාලයට ලැබෙන සියළුම උපකරණ | - | - | ලැබෙන සියලුම භාණ්ඩ අංක කිරීම | ලැබෙන සියලුම භාණ්ඩ අංක කිරීම | ලැබෙන සියලුම භාණ්ඩ අංක කිරීම |

# සංවර්ධන අංශය

| අනු අංකය | අරමුණ | ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPI) | පාදක අගය (2018 ප්‍රගතිය) | අත් කරගත් ප්‍රගතිය-2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 2019 | 2020 | 2021 |
| 1 | අමාත්‍යාංශසහ අනෙකුත් රේඛිය අමාත්‍යාංශ පලාත් සභා හා වෙනත් ආයතන මගින් ප්‍රතිපාදන සලසානොමැති ආර්ථික, සමාජිය, ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය භෞතිකයටිතල පහසුකම් ඇති කිරිම හෝ වැඩිදියුණු කිරිම. | විමධ්‍යගත අයවැයවැඩ සටහන | 4,6,7,9,11 | ව්‍යාපෘති සංඛ්‍යාව | 42 | 42 | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි |
| 2 | ග්‍රාමියප්‍රදේශවල දුගිකමතුරන් කර ජිවනෝපායසංවර්ධනය ප්‍රමුඛ වශයෙන් ඉලක්ක කොට ගෙන ඒවායේ යටිතල පහසුකම් නැංවිම | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 7,9,11 | ව්‍යාපෘති සංඛ්‍යාව | 17 | 17 | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි |
| 3 | රටෙහියටිතල පහසුකම් වල ගුණාත්මක තත්ත්වය දියුණු කිරිම සහ ජනතාවගේ ජිවනෝපාය සංවර්ධනයසඳහා උපකාර කිරිම සහ ආර්ථික සංවර්ධනය ඇති කිරිම | ගම්පෙරළිය වැඩසටහන | 7,9,11 | ව්‍යාපෘති සංඛ්‍යාව | 5 | 5 | 72 | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි |
| 4 | ශ්‍රිලංකාවේ පවතින නිරපේක්ෂ දරිද්‍රතාවය 2030 වන විට සම්පූර්ණයෙන් තුරන් කිරිම | ග්‍රාම ශක්ති වැඩ සටහන | 1,2,3,4,5, 6,7,8,9, 11,12,16 | ව්‍යාපෘති | 3 | 3 | 12 | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි |
| 5 | ප්‍රාදේශියලේකම් කොට්ඨාශයේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවිමේ ක්‍රියාවලිය මෙහෙයවිම, අධික්ෂණය ,පසුවිපරම සහ ඇගයිම | පෝෂණ වැඩ සටහන | 2, | වැඩසටහන් | 7 | 7 | 8 | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වි ලැබෙන පරිදි |

| අනු අංකය | අරමුණ | ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPI) | පාදක අගය (2018 ප්‍රගතිය) | අත් කරගත් ප්‍රගතිය-2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 2019 | 2020 | 2021 |
| 6 | මිනිසාගේසහ අනෙකුත් ජීවින්ගේ යහපැවැත්ම උදෙසා සොබාදහම උදෙසා සොබාදහම සමග වූ සබැදියාවතිරසර ලෙස පවත්වා ගැනිම | පරිසර සංරක්ෂණ වැඩ සටහන | 13,15, | වැඩසටහන් | 1 | 1 | 2 | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි |
| 7 | රටපුරාව්‍යාප්ත වී ඇති ඩෙංගු වසංගතය පිළිබඳව මහජනතාව දැනුවත් කරමින් ඩෙංගු මර්දනය සඳහාඔවුන්ගේ ක්‍රියාකාරිත්වය සක්‍රිය ලෙස ලබා ගැනිම. | ඩෙංගු මර්දන වැඩ සටහන | 3, | වැඩසටහන් | 53 | 53 | 53 | 53 | 53 |
| 8 | අමාත්‍යාංශසහ අනෙකුත් රේඛිය අමාත්‍යාංශහා වෙනත්ආයතන මගින් ප්‍රතිපාදන සලසා නොමැති ආර්ථික, සමාජිය, ආගමික හා සංස්කෘතික කටයුතුප්‍රවර්ධනය සඳහා අවශ්‍ය භෞතික යටිතල පහසුකම් ඇති කිරිම හෝ වැඩිදියුණු කිරිම. | පළාත් සභා සංවර්ධන වැඩ සටහන | 6,7,9,11 | වැඩසටහන් | 83 | 83 | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි |
| 9 | කොට්ඨාසයේසියළුම පවුල් ඒකකයන් සඳහා හොඳ තත්ත්වයේ ජල මුද්‍රිත වැසිකිළියක් ඉදි කිරිමටසහාය විම | සනීපාරක්ෂක පහසුකම් වැඩසටහන | 6, | ප්‍රතිලාභී පවුල් | 50 | 50 | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි | ව්‍යාපෘති අනුමත වී ලැබෙන පරිදි |
| 10 | කොට්ඨාසයේ තොරතුරු අවශ්‍ය කරන පාර්ශ්වයන් හට ක්ෂණිකව ලබා දීමේ පහසුවසහ කොට්ඨාසයේ සමස්ථ තොරතුරු පද්ධතිය එකම ස්ථානයක ප්‍රදර්ශනය කිරීමෙන්තොරතුරු ලබා ගැනීමේ කාලය ඉතිරි කර ගැනීම.සහතොරතුරු ඉදිරිපත් කිරීම සඳහා නිලධාරින්ගේ සහය අවශ්‍ය නොවීම | මෙහෙයුම් මැදිරිය යාවත්කාලීන කිරීම | 16 | අඩුකර ගත් කාලය | ගතවූ කාලය මාස-03 | ගතවූ කාලය මාස-03 | කාලය අඩුකර ගැනීම මාස 02 | නැත | නැත |

| අනු අංකය | අරමුණ | ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධක දර්ශක (KPI) | පාදක අගය (2018 ප්‍රගතිය) | අත් කරගත් ප්‍රගතිය-2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | **2019** | **2020** | **2021** |
| 11 | කොට්ඨාසයේ සමස්ථ තොරතුරු ඒකරාශි කර පොතක්ලෙස සකස් කොට අවශ්‍ය කරන පාර්ශ්වයන් හට ලබාදීමේ පහසුව පිණිස කාර්යාලයේ තබා ගැනීම සහදිස්ත්‍රික්කයේ දත්ත තොරතුරු එක්රැස් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්කාර්යාලය වෙත යොමු කිරීම | වාර්ෂික සම්පත් පැතිකඩ සකස් කිරීම | 16 | අඩුකරගත් කාලය | ගතවූ කාලය මාස-03 | ගතවූ කාලය මාස-03 | කාලය අඩුකර ගැනීම මාස 02 | නැත | නැත |
| 12 | වර්ෂය තුළ කාර්යාලයේ සහ ක්ෂේත්‍ර නිලධාරින්ගේ නිම කරන ලද වැඩ සටහන් ,ප්‍රගතිය සහ ආයතනයේ වියදම් ශිර්ෂයන් පිළිබඳ ප්‍රගතීන්එක්රැස්කොට වාර්තාවක් ලෙස සකස් කරදිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම | කාර්යාලීය කාර්ය සාධන වාර්තාව සකස් කිරීම | 16 | අඩුකරගත් කාලය | ගතවූ කාලය මාස-03 | ගතවූ කාලය මාස-03 | කාලය අඩුකර ගැනීම මාස 02 | නැත | නැත |
| 13 | මත්ද්‍රව්‍යනිවාරණය සම්බන්ධව විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම සහිත පුහුණු සම්පත් දායකසංචිතයක් නිර්මාණය කිරිම හා ඒ තුළින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ප්‍රජාවබලගන්වමින් ගම්මාන නිදහස් කර ගැනිම | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන - ග්‍රාමීය කමිටු යාවත් කාලීන කිරීම | 5, | ග්‍රාමීය කමිටු | 40 | 40 | 53 | 53 | 53 |

# ඉඩම් අංශය

| අරමුණ | උපාය මාර්ගික ක්‍රියාකාරකම | තිරසාර සංවර්ධන අරමුනු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI) | පාදක අගය (2013) | අත්කරගත් ප්‍රගතිය (2018) | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| ඉඩමක හිමිකම තහවුරු කිරීම | අවසාන ගම් පිඹුර හා ඉඩම් විස්තර ලයිස්තු ලැබී ඇති රේඛා චිත්‍ර පරීක්ෂා කර දීමනා පත්‍ර සකස් කිරීම | 11/16 | සකස් කල දීමනා පත්‍ර සංඛ්‍යාව | 50 | 50 | 100 | 100 | 100 |
| ඉඩමක හිමිකම තහවුරු කිරීම | දීමනා පත්‍ර සකස් කිරීමට ඇති ලැබී නොමැති රේඛා චිත්‍ර නැවත ගෙන්වා ගැනීම | 16/11 | | | | | | |
| ක්ෂේත්‍රයේ පවතින ඉඩම් ගැටලු නිරාකරණය කිරීම | ග්‍රා.නි මට්ටමින් ඉඩම් පළාත් දින පැවැත්වීම | 16 | පවත්වන ලද පළාත් දින ප්‍රමාණය | | 02 | 02 | 04 | 05 |
| භුක්ති විඳින ඉඩමේ අයිතිය තහවුරු කිරීම | 2008/4 චක්‍ර ලේඛය පරිදි අනවසරකරුවන් ලියාපදිංචි කර බලපත්‍ර ලබා දීම | 11/16 | ඉඩම් නියමානුකූල කර බලපත්‍ර ලබාදිය හැකි පුද්ගලයින් ගණන | - | 234 | 200 | 75 | 50 |
| ඉඩම් නොමැති පුද්ගලයින්ටඉඩමක අයිතිය ලබා දීම | 2008/4 චක්‍ර ලේඛය පරිදි ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම | 2. 1. 9 | ඉඩම් නොමැති පුද්ගලයන් ලියාපදිංචි කළහැකි සංඛ්‍යාව | - | 170 | 130 | 00 | 00 |
| රජයේ ඉඩම් ආරක්ෂා කිරීම | සන්තකය ආපසු පවරා ගැනීම යටතේ කටයුතු කිරීම | 16 | සන්තකය ආපසු පවරා ගත් ඉඩම් ප්‍රමාණය | - | 3 | 00 | 00 | 00 |
| කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව ඉහළ දැමීම | ඌණ පරිහරණ ඉඩම් වල කුට්ටිකානු කැපීම | 2, 5, 15 | පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය | - | 01 | 00 | 01 | 01 |
| ඉඩම් පරිහරණයවිධිමත් කිරීම | ග්‍රාම නිලධාරී වසමක් සඳහා ඉඩම් පරිහරණ සැළසුම් සැකසීම | 2,3.8,15 | පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය | - | 01 | 01 | 01 | 01 |
| ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශවල ඉඩම් විධිමත් කිරීම පරිහරණය | ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශවල ඉඩම් පරිහණ සැළසුම් සැකසීම | 2, 15 | සකස් කරන ලද සැලසුම් ප්‍රමාණය | - | - | 01 | 00 | 00 |
| ඉඩම් පැවරීමේදී පාර්ශව කාර ආයතන වල එකගතාව ලබා ගැනීම | ඉඩම් පරිහණ කමිටු පැවැත්වීම | 11. 15 | පවත්වන ලද කමිටු ප්‍රමාණය | - | 02 | 02 | 02 | 02 |

| අරමුණ | උපාය මාර්ගික ක්‍රියාකාරකම | තිරසාර සංවර්ධන අරමුනු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI) | පාදක අගය (2013) | අත්කරගත් ප්‍රගතිය (2018) | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| ඉඩම් පරිහරණය විධිමත් කර ඉඩම් ආරක්ෂා කර ගැනීම | සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 1, 2, 12, 13, 15, 4 | පවත්වන ලද වැඩ සටහන් ප්‍රමාණය | - | 01 | 01 | 01 | 01 |
| වෙනත් ආයතන සතු ඉඩම් වල අයිතිය තහවුරු කිරීම | නිවැරදි ලිපි ලේඛන සකස් කර වාර්තා සම්පූර්ණ කර පැවරුම් නියෝග සකස් කිරීම | 16 | සකස් කළ පැවරුම් නියෝග ගණන | - | 1 | 6 | 4 | 3 |
| නිසි කලට රජයේ ඉඩම් බදු ආදායම් රැස් කිරීම හා ගිණුම් ගත කිරීම | ග්‍රාම නිලධාරී හා අදාල පුද්ගලයින් දැනුවත් කර බදු මුදල් අයකර ගැනීම හා නිසි පරිදි ගිණුම් ගත කිරීම | 12,13,15 | නියමිත දිනට අය කරන ලද බදු මුදල | 46633 2.50 | 441058.10 | 6269 55.66 | 6500 00.00 | 70000 0.00 |
| රජයේ ඉඩමක විධිමත් අයිතිය ලබා දීම | ක්ෂේත්‍ර තොරතුරු ලබා ගෙන වාර්තා සම්පූර්ණ කර දීර්සකාලීන බදුකර සකස් කිරීම | 12,13,15 | සකස් කරන ලද දීර්සකාලීන බදුකර ප්‍රමාණය | - | - | 50 | 20 | 10 |
| රජයේ ඉඩමක විධිමත් අයිතිය ලබා දීම | ක්ෂේත්‍ර තොරතුරු ලබා ගෙන වාර්තා සම්පූර්ණ කර ගැණුම් මිළ බලපත්‍ර සකස් කිරීම | 12,13,15 | සකස් කරන ලද ගැණුම් මිළ බලපත්‍ර ප්‍රමාණය | 04 | 06 | 20 | 10 | 10 |
| රක්ෂිත ඉඩම් ආරක්ෂා කිරීම හාපරිහරණය විධිමත් කිරීම | L.C. 78 වෙනුවට L.C. 75 බලපත්‍ර නිකුත් කිරීම | 12,13,15 | සංශෝධනය කරන ලද L.C. 75 බලපත්‍ර ප්‍රමාණය | - | - | 70 | 05 | 05 |
| රක්ෂිත ඉඩම් ආරක්ෂා කිරීම හාපරිහරණය විධිමත් කිරීම | L.C. 78 ( වාර්ෂික බලපත්‍ර) ඉඩම් වල අයිතිය සංශෝධනය කිරීම | 12,13,15 | සංශෝධනය කරන ලද L.C. 78 බලපත්‍ර ප්‍රමාණය | - | - | 20 | 04 | 05 |
| වන්දි ගෙවීමේ කටයුතු කඩිනම් කිරීම | මැනුම් ගැටළු කඩිනමින් විසඳා ගැනීම සහ තක්සේරු වාර්තා කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම | 16 | වන්දි ගෙවන ලද කැබලි ගණන | 11 | - | 229 | 30 | 40 |
| තක්සේරුව ලැබී 17 යටතේ නිවේදන නිකුත් කිරීම | ලිපිය ලැබී දින 3 ක් ඇතුළත ඉඩම් හිමිකරුවන් සඳහා වන්දි ප්‍රකාශ යැවීම | 16 | කැබලි ගණන | | | 112 | 100 | 50 |

# සමාජසේවා අංශය

## 5.1).සමාජ සේවා ( පළාත් සභා)

| අරමුණ | උපාය මාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු **(SDG)** | ප්‍රධාන කාර්යය සාධන දර්ශක **(KPI)** | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| දිළිඳු බව තුරන් කිරීම | මහජනාධාර ලබා දීම. | 01 | ප්‍රතිලාභීන් ගණන | 59 | 59 | 66 | 70 | 75 |
| සනීපාරක්ෂාව හා පෝෂණ මට්ටම ඉහළ නැංවීම | රෝගාධාර ලබා දීම. | 03 | ප්‍රතිලාභීන් ගණන | 24 | 24 | 25 | 27 | 28 |
| ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම | ස්වයං රැකියා ආධාර ලබා දීම. | 02 | ප්‍රතිලාභීන් ගණන | 04 | 04 | 04 | 04 | 04 |
| හානියට පත් නිවාස යළි පිළිසකර කිරීම | නිවාස ආධාර ලබා දීම. | 03 | ප්‍රතිලාභීන් ගණන | 03 | 04 | 05 | 05 | 05 |
| ජීවන තත්ත්වය ඉහළ නැංවීම | අනියම් සහනාධාර ලබා දීම. | 03 | ප්‍රතිලාභීන් ගණන | 20 | 30 | 34 | 35 | 37 |

# 5.2). සමාජ සේවා - මධ්‍ය රජය

| අරමුණ | උපායමාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයාගේ හැකියාවට සරිලන රැකියාවකට හුරු කිරීම | 01.ආබාධ සහිත තරුණ තරුණියන් වෘත්තීය පුහුණුවට යොමු කිරීම | 08 | ප්‍රතිලාභීන් | - | 05 | 08 | 10 | 12 |
| විශේෂ අවශ්‍යතා සහිත වූවන්ට සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 02.විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ මූලික අවශ්‍යතාවයන් වඩාත් ප්‍රශස්ථ අයුරින් සපුරා ගැනීමට අවශ්‍ය පහසුකම් සපුරාලීම. (කොමඩ්, ජලය, විදුලිය, ප්‍රවේශ පහසුකම්) | 06 | ප්‍රතිලාභීන් | - | 01 | 02 | 02 | 03 |
| ආර්ථික සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා පුද්ගලයා සවිබලගැන්වීම | 03. තනි මාපිය හා විශේෂ අවශ්‍යතා සහිත පවුල් ඒකක සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම. | 01 | ප්‍රතිලාභීන් | - | 01 | 02 | 02 | 02 |
| පවුල තුළ දරුවා පුනරුත්ථාපනය කිරීම | 04.විශේෂ අවශ්‍යතා සහිත දරුවන් නිවෙස් මට්ටමින් පුනරුත්ථාපනය | 03 | ප්‍රතිලාභීන් | - | 03 | 04 | 05 | 06 |
| ජීවිත සුරක්ෂිතතාවය ඇති කිරීම | 05.සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයින් බඳවාගැනීම | 03 | ප්‍රතිලාභීන් | - | 25 | 30 | 35 | 50 |
| විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා නීරෝගීමත් ජීවිතයක් සහතික කිරීම හා යහජීවනය ප්‍රවර්ධනය කිරීම | 06. විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා මානසික සෞඛ්‍ය පෝෂණ හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් | 03 | වැඩසටහන් | - | 05 | 06 | 07 | 10 |

# 5.3).උපදේශන සේවා

| අරමුණු | උපායමාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධානකාර්ය සාධනදර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත්ප්‍රගතිය 2018 | ඉලක්කය 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|
| සේවාලාභීන් ගේ විවිධ මානසික ගැටළු විසඳා ගැනිමට මනෝවිද්‍යාත්මක ක්‍රමවේද භාවිතයෙන් උපදේශන සේවා සැපයිම, උග්‍ර මානසික අක්‍රමිකතාවයන් ඇතිවිම වළක්වාලීමට මනෝ ප්‍රතිකාර කිරිම හා අවශ්‍ය වුවන් මනෝවෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු කිරිම සහ පෞරුෂය සංවර්ධනය තුළින් ප්‍රජාවගේ මානසික සෞඛ්‍ය වර්ධනයට දායකවීම. | මනෝවිද්‍යාත්මක උපදේශන සායන පැවැත්විම | 03 | පවත්වනු ලැබූ සායන ගණන | 67 | 81 | 96 | 105 | 120 |
| මානසික ගැටළු ඇතිවිම වැළැක්විම, අවම කිරිම සහ පුද්ගල කුසලතා වර්ධනය තුළින්නීරෝගිමත් ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම. | යහපත් සෞඛ්‍ය සුභසාධනය, හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | 03 | වැඩසටහන් ගණන | 04 | 12 | 15 | 18 | 20 |
| දුප්පත් සහ අවදානම් පිරිස් සවිබල ගැන්විමට අදාළව ආදායම්-වියදම් කළමනාකරණ හැකියා වර්ධනය. ඔවුන් ගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කර පවුල් සබඳතා ශක්තිමත් කිරිම සහ කායික-මානසික-සාමාජීය සහ අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණත්වයට පත්කිරිම | මානසික දිළිඳු බවින් මිදීමේ මනෝවිද්‍යාත්මක වැඩසටහන් පැවැත්විම | 01 | වැඩසටහන් ගණන | - | 09 | 12 | 15 | 17 |
| ඉගෙනුම් හැකියා වර්ධනය, ආකල්ප සහ පෞරුෂය සංවර්ධනය, ඉගෙනුම් අක්‍රමිකතා වළක්වාලිමට කටයුතු කිරිම,නායකත්ව කුසලතා වර්ධනය කිරිම. චිත්තවේග කළමනාකරණය. ජීවන නිපුණතා පුහුණු කිරිම. | අධ්‍යාපන උපදේශන වැඩසටහන් පැවැත්විම | 04 | වැඩසටහන් ගණන | 06 | 19 | 25 | 27 | 30 |
| සතුටු පවුල් බිහිකිරිම. ප්‍රජාතන්ත්‍රවාදී පවුල් නිර්මාණය. අන්තර් පුද්ගල සබඳතා වර්ධනය, ධනාත්මක දෙමාපිය භාවයන් වර්ධනය. ගැටුම් අවම පවුල් පසුබිම් නිර්මාණය, සහකම්පන ආකල්ප වර්ධනය. | මනෝවිද්‍යාත්මක පවුල් උපදේශන වැඩසටහන් පැවැත්විම | 05 | වැඩසටහන් ගණන | 04 | 11 | 15 | 17 | 20 |

# 5.4).මුල් ළමාවිය සංවර්ධන සහකාර

| අරමුණ | උපායමාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| යහපත් මුල් ළමාවිය පරපුරක් බිහි කිරීම | පෝෂණ දීමනා වව්චර්පත් ලබා ගැනීමට පැමිණෙන මව්වරුන් සඳහා දැනුවත් කිරීමේ පත්‍රිකාවක් ලබා දීම | 03 | ප්‍රතිලාභීන් ගණන | - | - | 600 | 600 | 600 |
| මුල් ළමාවිය දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම | පෙර පාසල් දරුවන්ගේ ආහාර පිළිබඳ ඔවුන්ගේ දෙමව්පියන් දැනුවත් කර එය පෙර පාසල් තුළ ක්‍රියාත්මක කිරීම | 02 | වැඩසටහන් ගණන | - | - | 12 | 12 | 12 |
| මුල් ළමාවියේ සිටම තිරසර පරිභෝජන රටාවකට සහ නිෂ්පාදන රටාවකට හුරු කිරීම | පෙර පාසල් භූමියේ ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 02 | වැඩසටහන් ගණන | - | - | 12 | 12 | 12 |

# 5.5). ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී

| අරමුණ | උපාය මාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්යය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| දිළිඳු බව පිටුදැකීම හා ළමුන්ට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම | අවදානම් සහිත ළමුන් සිටින පවුල් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම හා ආධාර ලබා දීම. | 01 | ප්‍රතිලාභීන් ගණන | - | 35 | 40 | 45 | 50 |
| දරුවන්ගේ අධ්‍යාපන අයිතීන් සුරක්ෂිත කිරීම | අඩු ආදායම්ලාභී පාසල් ළමුන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම. . | 04 | ප්‍රතිලාභීන් ගණන | - | 25 | 30 | 35 | 37 |
| දරුවන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය කිරීම | ළමා සහභාගීත්ව අයිතීන් ප්‍රවර්ධනය හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 04 | වැඩසටහන් ගණන | - | 09 | 10 | 12 | 15 |

# 5.6). කාන්තා කටයුතු

| අරමුණ | උපායමාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | **2019** | **2020** | **2021** |
| සියළුම ස්වයං රැකියා කරනු ලබන කාන්තාවන් සවිබල ගැන්වීම | චක්‍රීය ණය ලබාදීම | 05 | ප්‍රතිලාභීන් ගණන | 12 | 17<br><br>(5/12)*100<br>42% | 20 | 25 | 28 |
| සනීපාරක්ෂක පහසුකම් සැපයීම | වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන්ට වැසිකිලි ආධාර ලබාදීම | 06 | ප්‍රතිලාභීන් ගණන | - | 03 | 04 | 05 | 06 |
| ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම | කාන්තාව හා නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 05 | වැඩසටහන් ගණන | - | 02 | 03 | 04 | 05 |

# 5.7).උපදේශන කටයුතු

| අරමුණ | උපායමාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| සියළු කාන්තාවන් හා ගැහැණු දරුවන් සවිබල ගැන්වීම | 01.ළමා හා කාන්තාවන්ගේ මනෝ සමාජ ගැටළු හඳුනා ගැනීම හා ඔවුන් සවිබල ගැන්වීමේ උපදේශන වැඩසටහන් පැවැත්වීම | 05 | වැඩසටහන් ගණන | - | - | 10 | 12 | 14 |
| නීරෝගිමත් ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම | 02.මනෝ උපදේශන හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | 03 | වැඩසටහන් ගණන | - | - | 08 | 10 | 12 |
| සියළු ගැහැණු හා පිරිමි ළමයින් සඳහා උසස් තත්ත්වයේ පූර්ව ළමාවිය සංවර්ධනයක් ඇති කිරීම. | 03.මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 04 | වැඩසටහන් ගණන | - | - | 04 | 05 | 06 |

# 5.8).වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී

| අරමුණ | උපායමාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| 01.ජ්‍යෙෂ්ට පුරවැසියන් සඳහා ලබාදෙන සේවාවන්වලදී ප්‍රමුඛතාවය ලබාදෙමින් ඔවුනට අභිමානයක් ලබාදීම | වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම | 03 | ප්‍රතිලාභීන් | 88 | 96 | 150 | 170 | 180 |
| 02. කායික මානසික නීරෝගිතාව ඇති කිරීම | ආයුර්වේද වෛද්‍ය සායන | 03 | වැඩසටහන් | 01 | 02 | 04 | 05 | 06 |
| 03. වැඩිහිටියන්ගේ මානසික සුවතාවය ඉහළ නැංවීම | උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන් | 03 | වැඩසටහන් | 03 | 12 | 18 | 20 | 22 |

# 5.9). ප්‍රාදේශීය ළමා ආරක්ෂණ කටයුතු

| අරමුණ | උපායමාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු(SDG) | ප්‍රධාන කාර්ය සාධන දර්ශක(KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කරගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| පාසල තුළ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම හා ළමුන්ගේ ගැටළු හදුනාගැනීම | 01.පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ප්‍රතිසංවිධානය කිරීම | 4/5/16 | පිහිටුවනු ලැබූ කමිටු ගණන | - | - | 6 | 8 | 9 |
| පාසල් යා යුතු වයසේ සියළු ළමුන්ගේ අධ්‍යාපන අයිතිය සුරැකීම හා සියළු ළමුන්ගේ ස්වයං ආරක්ෂාව තහවුරු කිරීම | 02.පාසල් නොයන දරුවන් පාසල්ගත කිරීම හා පාසල තුළ දරුවන් සවිබලගැන්වීම | 4/5/16 | සවිබල ගැන්වූ දරුවන් ගණන | - | - | 15 | 25 | 30 |
| | I.පාසල් නොයන හා කඩින්කඩ පාසල් යන දරුවන් වසම් මට්ටමින් හදුනාගැනීම හා පාසල්ගත කිරීම | 4/5/16 | ප්‍රතිලාභීන් ගණන | - | - | 15 | 18 | 20 |
| | II. පාසල ළමුන් සදහා ජීවන නිපුණතා හා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 4/5/16 | වැඩසටහන් ගණන | - | - | 06 | 06 | 06 |
| වින්දිත ළමුන්ගේ රහස්‍යභාවය සුරකිමින් ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට කිරීම හා අයිතීන් තහවුරු කිරීම | 03.වසම් මට්ටමින් ළමා අපයෝජනයන්ට ලක් වූ දරුවන් රහසිගතව හදුනාගැනීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම හා ආයතනයන් වෙත සම්බන්ධ කිරීම. (පාසල් ළමා ආරක්ෂක කමිටුව හා ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු තෝරාගත් සමාජීකයන්ගේ තොරතුරු මගින්) | 4/5/16 | ප්‍රතිලාභීන් ගණන | - | - | 15 | 18 | 20 |
| ළමුන්ගේ උපරිම යහපත සැලසෙන පරිසරයක් ගම | 04.ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේහා ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන් | 4/5/16 | වැඩසටහන් ගණන | - | - | 12 | 12 | 12 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| තුළ නිර්මාණය කිරීම | පැවැත්වීම | | | | | | | |

## 5.10). ආපදා සහන සේවා

| අරමුණ | උපාය මාර්ගික ක්‍රියාකාරකම | තිරසර සංවර්ධන අරමුණු (SDG) | ප්‍රධාන කාර්යය සාධන දර්ශක (KPI) | පාදක අගය (2013 ප්‍රගතිය) | අත්කර ගත් ප්‍රගතිය 2018 | ඉලක්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2019 | 2020 | 2021 |
| කොට්ඨාසය තුළ ස්වාභාවික විපත් වලින් පීඩා විඳින පවුල් ගණන අවම කිරීම. | නැවත පදිංචි කිරීමේ වැඩසටහනට යොමු කළ හැකි ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සඳහා නායයාම් ආපදාවලට ලක්වීමේ ආවදානම් සහිත නිවාස හඳුනා ගෙන නිර්දේශ ලබා ගැනීම සඳහා NBRO වෙත යොමු කිරීම. | 13 | NBRO වෙත යොමු කරන ප්‍රතිලාභීනිවාස ගණන | - | 7 | තාවකාලික නිවාස, පැල්පත් නිවාස සහ අධි අවධානම් සහිත නිවාස පිළිබඳ සමීක්ෂණය මඟින් නිවාස ගණන හඳුනා ගෙන ඉදිරිපත් කිරීම. | | |
